# ඇබෑර්තු

දිවයිනේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය බැංකුවක අනුබද්ධිත ආයතනයක් වන අප ආයතනය කොළඹ පුරෝගාමී මහල් ගොඩනැගිල්ලක හිමිකරුවන්වේ. ආයතනයේ මූලික මෙහෙයුම් ක්‍රියාදාමය වනුයේ ගොඩනැගිල්ලේ තත්වය ඉහළ මට්ටමක පවත්වාගෙන යෑම සහ ඒ සඳහා අදාළ ගෘහ නිර්මාණ ශිල්පය, විදුලි කාර්මික, ජලනළ පද්ධතීන් සහ වර්ග අඩි 600,000 ගොඩනැගිල්ල සඳහා අනෙකුත් සේවාවන් පවත්වාගෙන යෑමයි. ඒ අනුව පහත ඇබෑර්තු සඳහා ඉහළ හැකියාවන් ඇති අයවළුන් ආයතනය විසින් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

**ජ්‍යෙෂ්ඨ කාර්මික තනතුරු - ජලනළ / විදුලි / වායු සමීකරණ**

- විෂයන් හයකට සාමාර්ථ සහිතව අ.පො.ස. සා/පෙළ සමත්වීම.
- පිළිගත් කාර්මික ආයතනයක ජලනළ / විදුලි / වායු සමීකරණ පිළිබඳ අවම වශයෙන් එක් වසරක පූර්ණ කාලීන සහතික පත් / ඩිප්ලෝමා (NVQ Level 4) පාඨමාලාවක් හදුරා තිබීම.

  පළපුරුද්ද අනුව මෙම සුදුසුකම ලිහිල් කෙරේ.
- පිළිගත් ආයතනයන්හි අවමවශයෙන් වසර 08 ක ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතුය.
- ඉල්ලුම් කරන දිනට වයස අවුරුදු 50 ට අඩු විය යුතුය.

**කනිෂ්ඨ කාර්මික තනතුරු - ජලනළ / විදුලි / පෙදරේරු / වායු සමීකරණ**

- විෂයයන් හයකට සාමාර්ථ සහිතව අ.පො.ස. සා / පෙළ සමත්වීම
- පිළිගත් කාර්මික ආයතනයක ජලනළ / විදුලි / පෙදරේරු / වායු සමීකරණ පිළිබඳ අවම වශයෙන් මාස 06 ක පූර්ණ කාලීන සහතික පත් / ඩිප්ලෝමා (NVQ Level 3) පාඨමාලාවක් හදුරා තිබීම. පළපුරුද්ද අනුව මෙම සුදුසුකම් ලිහිල් කෙරේ.
- පිළිගත් ආයතනයන්හි අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.
- ඉල්ලුම් කරන දිනට වයස අවුරුදු 40 ට අඩු විය යුතුය.

ඔබ පිළිබඳ ස්වාධීනව තොරතුරු ලබාදිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර සහිතව 2026 ඔක්තෝබර් මස 12 පෙර සියලු සහතිකවල පිටපත් සමග අයදුම් කරන්න.

ඔබ අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් පස උඩ කෙළවරෙහි හෝ විද්‍යුත් තැපැලෙන් අයදුම් කරන්නේ නම් Subject හි තනතුර සඳහන් කරන්න.

**මානව සම්පත් හා පරිපාලන කළමනාකරු**
**ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්**
**19 වන මහල,**
**ලංකා බැංකු මූලස්ථානය, කොළඹ 01.**
**විද්‍යුත් තැපෑල : allofficevacancies@gmail.com**

Gazette.lk